**නාවලපිටිය නගර සභාව - 2021**
**-------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

නාවලපිටිය නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නාවලපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව
-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු.620,220 ක විවිධ ණය හිමි ශේෂ 16 ක අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | රු.71,227 ක් වූ ණයහිමි ශේෂ ගිණුම්ගත කර ඇති බවත් ඉතිරි ණයහිමි ශේෂ නිවැරදි කිරීමටත් කටයුතු කරන බවත් දන්වා ඇත. | ණයහිමි ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | කර්මාන්ත ණය හිමි ශේෂ 02 ක අගය රු.769,304 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අදහස් දක්වා නැත. | කර්මාන්ත ණයහිමි ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී රු.4,937,837 ක් වැයකර නිමකර තිබුණු කර්මාන්ත 04 ක වටිනාකම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාළ වටිනාකම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ප්‍රාග්ධන වැය යටතේ සිදුකරන වියදම් ප්‍රාග්ධනිත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වත්කම් විෂයයන් දෙකකට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.31,010,837 ක් වුවද ඒ සමඟ ඉදිරිපත් කර තිබුණු උපලේඛන අනුව ශේෂය රු.30,519,554 ක් වූයෙන් රු.491,283 ක වෙනසක් පැවතුණි. | ලේඛන පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු යොදා ඇති බව දන්වා ඇත. | වෙනස්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය. |

1.7 අනුකූල නොවීම්

---------------------

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සහා ආඥා පනතේ 157 (6) (උ) වගන්තිය | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරු වෙනුවෙන් අයවිය යුතු රු.991,063 ක ගාස්තු අයකර ගෙන නොතිබුණි. | දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට ලිපි යවා ඇති බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකර ගත යුතු අතර දැන්වීම් පුවරු සමීක්ෂණය කර ගාස්තු අය කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) | තත්කාර්යය අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසුව අදාළ කාර්යය අවසන් කළ විගස පියවිය යුතු වුවද අවස්ථා 17 කදී ලබා දී තිබුණු රු.383,157 ක තත්කාර්යය අතුරු අග්‍රිම පියවීමේදී දින 03 සිට දින 138 අතර කාල පරාසයක ප්‍රමාදයක් සිදු වී තිබුණි. | මේ වන විට කාල ප්‍රමාදයකින් තොරව අග්‍රිම පියවීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,422,917 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,314,465 ක් විය.

2.2 මූල්‍ය පාලනය

-------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ පොදු ගිණුමට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව බැංකුවේ සහ මුදල් පොතේ සිදුවී ඇති වෙනස්කම් ලෙස 2019 ජනවාරි 10 වැනි දින තැන්පත්කරන ලද රු.736,000 ක් වූ මුදල හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | සභාවේ සුපිරි වෙළඳ සංකීර්ණයට අදාළ ව්‍යාපාරිකයින් විසින් සෘජුවම නගර සභා ගිණුමට තැන්පත් කරන ලද මුදලක් වන බවත් එම විස්තර සභාව වෙත මෙතෙක් ලබාදීමට කටයුතු කර නොමැති බැවින් බැංකු සැසඳුම් ප්‍රකාශයේ වෙනම පෙන්වා ඇති බව දන්වා ඇත. | තැන්පතු පිළිබඳව සොයා බලා නිවැරදි කළ යුතුය. |

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් බදු දීමට අදාළව ලැබිය යුතු හිඟය රු.779,002 ක් වූ අතර ඒ තුළ වසර 05 ක් ඉක්මවූ ශේෂය රු.538,522 ක් විය. | අදාළ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බවත්, නොගෙවන්නන්ට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා ඇත. | හිඟ මුදල් අයකර ගත යුතුය. |
| (ආ) | නාවලපිටිය සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 176 ක් සඳහා 2018 ජනවාරි 08 දින කරන ලද තක්සේරුව අනුව කුලී අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට රු.73,193,570 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි. | නව කඩ කුලී තක්සේරු මුදල ගෙවීමට එකඟ නොවීම මත නඩුවක් පවරා ඇති බවත් 2018 වර්ෂයේ සිට කඩ කුලී නොගෙවීම මත මෙම මුදල් හිඟව පවතින බව හා කොටස් වශයෙන් ගෙවීම් සිදුකරන බව දන්වා ඇත. | වසර 05 කට වරක්වත් කඩ කාමර තක්සේරු කර නියමිත කුලී අයකළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු.896,074 ක් වූ අතර ඒ තුළ වසර 1 සිට 3 ත් අතර කාලපරාසයක් ගත වූ රු.68,100 ක් සහ වසර 03 කට වැඩි කාලයක් හිඟ හිටි රු.765,174 ක් විය. | ජල සම්පාදන මණ්ඩලයට පවරන ලද ජල යෝජනා ක්‍රමයේ හිඟය කපා හැරීමටත්, ඉතිරි ජල යෝජනා ක්‍රමයට අදාළ හිඟය අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රථවාහන නවතා තැබීමේ ගාස්තු හිඟය රු.5,251,532 ක් වූ අතර ඒ තුළ වසර 01 සිට වසර 05 අතර, කාල පරාසයට අදාළ හිඟය රු.3,515,457 ක් ද වසර 05 ට වඩා වැඩි හිඟය රු.902,944 ක් ද විය. | මෙම මුදලින් කොටසක් 2020 ජූලි 27 ගෙවා ඇති බවත් ඉතිරි මුදල් අයකර ගැනීමට රථවාහන හිමියන් සඳහා අවසන් නිවේදනය නිකුත් කර ඇත. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ලැබිය යුතු හිඟ වැසිකිළි ගාස්තුව රු.1,269,174 ක් වූ අතර එම හිඟයෙන් වර්ෂය තුළ අයවීම රු.49,010 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු.1,225,164 ක් විය. | 2022 ජූනි 30 දිනට කොටසක් පියවී ඇති බවත් ඉතිරි හිඟය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 සැප්තැම්බර් මස සිට 2021 නොවැම්බර් මාසය දක්වා වූ කාලය තුළ වරිපනම් ආදායම් රැස්කරන නිලධාරිනිය විසින් නිවැරදි වරිපනම් නිකුත් කිරීමේ ගොනුවෙන් පරිබාහිරව වෙනත් ගොනුවක් (Folder) මඟින් වරිපනම් බිල්පත් නිකුත් කර එම ආදායම් සභාවට නොගෙවා රු.1,527,688 ක් වරිපනම් ආදායම් විෂයභාර නිලධාරිනිය විසින් ව්‍යාජව ලබාගෙන තිබුණි. | මූලික විමර්ශනයක් සිදුකර ඇති බවත් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බවත් දන්වා ඇත. | ආදායම් අයකිරීම් සම්බන්ධයෙන් පවත්නා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළයුතුවේ. වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගතයුතුවේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ක්‍රීඩාංගණය ක්‍රීඩා කටයුතු සඳහා ලබාදීම තුළින් අයකර ගැනීමට තිබුණු රු.1,695,180 ක ආදායම් අයකර නොතිබුණු අතර ඒ තුළ වසර 02 කට වඩා හිඟ හිටි රු.1,429,080 ක ශේෂයක්ද පැවතුණි. | විෂය නිලධාරීන්ගේ නොසැළකිලිමත්කම මත ණය ගැති ලෙස නොපෙන්වා ඇති බවත් හා ඒ පිළිබඳව සොයාබලා සමුච්චිතය සමඟ ගැලපීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | වාර්ෂික ආදායම් හා හිඟ ශේෂ අයකර ගත යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු රු.1,665,000 ක් වටිනා මෝටර් වාහන 02 ක් වසර 04 කට වැඩි කාලයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | වාහන 02 ක් අක්‍රීය වී ඇත. අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට ඇති බැවින් නවතා ඇත. | අලුත්වැඩියා කටයුතු සිදුකර භාවිතයට ගත යුතුය. |

3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාවලපිටිය සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා සභාව විසින් 2008 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.252,191,942 ක් වැයකර තිබුණ ද 2021 දෙසැම්බර් 15 විගණිත දිනය වන විටත් සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකර ඇති ඉඩම නගර සභාවට පවරා ගෙන නොතිබුණි. | කැබිනට් මණ්ඩල තීරණ අනුව නගර සභාව වෙත පවරා දෙන ලෙස ඉල්ලීම් කර ඇතත් මේ දක්වා පවරා දීමට කටයුතු කර නොමැති බව දන්වා ඇත. | ඉදිකිරීම් සිදු කිරීමට පෙර ඉඩමේ අයිතිය පවරා ගත යුතු අතර මෙම ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ සිට අවස්ථා 10 කදී රු.21,950,873 ක් වැය කර ඉඹුල්පිටිය පරිසර සංරක්ෂණ මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු සිදුකර තිබුණ ද එම ගොඩනැගිල්ල අයත් ඉඩම විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | සංවර්ධන ව්‍යාපෘති හෝ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා අරමුදල් යෙදවීමට ප්‍රථම අදාළ ඉඩම් පවරා ගත යුතුය. |

3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතු රු.1,488,572 ක සේවක ණය ශේෂයක් පැවති අතර එම ශේෂය තුළ සේවය හැර ගොස් සිටි නිලධාරීන් 17 කින් අයවිය යුතු වසර 04 සිට වසර 28 දක්වා කාලයක් ගත වූ රු.427,725 ක ණය ශේෂ ද, විශ්‍රාම ගොස් මාස 10 ත් වසර 33 ත් අතර කාල පරාසයක් ගත වූ රු.339,696 ක ණය ශේෂ 14 ක් ද, විය. | මේ පිළිබඳව සොයා බලා අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | ණය ශේෂ අයකර ගත යුතුය. |